- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) ශුද්ධ ස්වර දෙකක් පමණක් යෙදෙන ස්වර ස්ථාපන ගීතයකි.
(1) ගී ගයන මේ කුරුළු　　(2) එකට සතුටු සාගරේ
(3) ඈත ආකාසේ පාට පාට මල්　　(4) කඳු පෙළ අතරේ තුරු වදුලේ

(02) උත්තර භාරතීය සංගීතය හඳුන්වන තවත් නමකි.
(1) පෙරදිග සංගීතය　　(2) බටහිර සංගීතය
(3) කර්ණාටක සංගීතය　　(4) හින්දුස්ථානි සංගීතය

(03) ආරෝහණ ක්‍රමයට අයත් ස්වර ඛණ්ඩය වනුයේ,
(1) ස ම ග රි　　(2) ප ම ග රි　　(3) ස ග ම ප　　(4) ම ග රි ස

(04) කඳු කඳු නැගෙනා .......................... යන ගී පාදයේ ලඝු ගුරු මාත්‍රා සංඛ්‍යාවල එකතුව වනුයේ,
(1) මාත්‍රා 08 කි.　　(2) මාත්‍රා 07 කි.　　(3) මාත්‍රා 05 කි.　　(4) මාත්‍රා 06 කි.

(05) නරිබෑණා නාට්‍යය නිෂ්පාදනය කරන ලද්දේ,
(1) ජෝන් ද සිල්වා මහතා ය.　　(2) චාල්ස් ඩයස් මහතා ය.
(3) දයානන්ද ගුණවර්ධන මහතා ය.　　(4) එදිරිවීර සරච්චන්ද්‍ර මහතා ය.

(06) ළමා ගීතයක් වනුයේ,
(1) අද වෙස්සන්තර රාජ පුතා　　(2) සෙන්පතියන් ගැන
(3) මෙම ගිම්හාන ග්‍රීෂ්ම වූ　　(4) සුවඳ පද්ම මලු ආදි

(07) සර්පිනාව පිළිබඳ නිවැරදි කියමන වනුයේ,
(1) තත් වාද්‍ය භාණ්ඩයකි.　　(2) බෝවෙන් වාදනය කරනු ලබයි
(3) සුෂිර වාද්‍ය භාණ්ඩ ගණයට අයත් ය.　　(4) තාල වාද්‍ය භාණ්ඩයකි.

(08) මුරලි හා බන්සුරි යනුවෙන් වර්ග දෙකකින් යුත් වාද්‍ය භාණ්ඩයකි.
(1) ගිටාරය　　(2) බටනලාව
(3) තබ්ලාව　　(4) වයලීනය

(09) |ප-ප- |ම-ප ම | ග-ම ග | රි - - - | යන ස්වර පාදය ඇතුළත් ගී පාදය යි.
(1) සමනල පෙරහැර මුණසිරි පාදේ　　(2) තුටිනා බුදු ගී ගයනා ජනයා
(3) ගී නාදේ ගැමියා මවනා　　(4) ගංගාවේ හා වෙල් යායේ



LIVEWORKSHEETS